## සාමාන්‍ය සමයේ දස නවවන සතිය
## සඳුදා

## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහය පොතෙන් ගත් පාඨයෙකි.

ද්විතීය නීති සංග්‍රහය 10: 12-22

**"ඔබ ද ආගන්තුකයන් ව සිටි බැවින් මොවුන්ට ප්‍රේමය දක්වන්න."**

"දැන් ඉතින් ඉශ්රායෙල් ජනයෙනි, දෙවි සමිඳාණන් වහන්සේට ඔබෙන් වුවමනා වී ඇත්තේ කුමක්ද? වුවමනා වී ඇත්තේ දෙවි සමිඳාණන් වහන්සේට ගරු බිය පෑමත්, උන් වහන්සේගේ සියලු මාර්ගවල යැමත් උන් වහන්සේට ප්‍රේම කිරීමත්, ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද උන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමත්, මා අද දින ඔබේ ශුභ සිද්ධිය තකා ඔබට අණ කරන උන් වහන්සේගේ අණ පණත්, නීති හා නියෝග පිළිපැදීමත් ය. බලන්න, ස්වර්ගයත්, උපරිම ස්වර්ගයත්, පොළොවත් එහි ඇති සියල්ලත් අයිති ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ය. එහෙත් උන් වහන්සේ ඔබේ පියවරුන්ට ඉමහත් ප්‍රේමයක් දක්වමින් ඔවුන්ගෙන් පසු අද පවතින පරිදි, ඔවුන්ගේ පෙළපත වන ඔබ ද අන් සියලු ජාතීන්ට වඩා උසස් කරගත් සේක. එබැවින් ඔබේ සිත් සතන්හි පාප මල කපා හැර, මින්පසු මුරණ්ඩු නොවන්න. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ දේවාති දේව ය. ස්වාමිවරුන්ගේ සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ මහා බලසම්පන්න, බිය උපදවන සුළු, මිනිසුන්ගේ තරාතිරම් නොබලන, අල්ලස් නොගන්න දෙවියන් වහන්සේ ය. උන් වහන්සේ අනාථ වූවන්ට හා වැන්දඹුවන්ට යුක්තිය ඉටු කරන සේක. ආගන්තුකයන් හට කෑම, ඇඳුම

දෙමින් ප්‍රේමය දක්වන සේක. එබැවින්, ඔබ ද මිසර දේශයෙහි ආගන්තුකයන් ව සිටි බැවින් මොවුන්ට ප්‍රේමය දක්වන්න. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් ඔබ ගරු බිය දක්වමින් උන් වහන්සේට පමණක් වැඳුම් පිදුම් කළ යුතු ය. උන් වහන්සේට පමණක් ඇලුම් ව සිටිය යුතුය. උන් වහන්සේගේ නාමයෙන් පමණක් දිවුරුම් දිය යුතුය. ඔබ ප්‍රශංසා කළ යුත්තේ, බල බලා සිටියදී ම මේ මහා භයානක දේවල් ඔබ උදෙසා ඉටු කළ, ඔබේ දෙවියන් වහන්සේට ය. ඔබේ පියවරුන් මිසර දේශයට යන විට සිටියේ හැත්තෑ දෙනෙකි. එහෙත්, දැන් නම් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ අහසේ තරු මෙන් ගණනින් ඔබ වැඩි වර්ධනය කර ඇත.”

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 147: 12-15, 19-20

පිළිතුර: සකල ජාතිනි, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය:

එම්බා ජෙරුසලම, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
සියොන් ගිර, තිගේ දෙවිඳුන්ට ප්‍රශංසා කරන්න. මන්ද, එතුමාණෝ තිගේ වාසල් දොරටුවල අගුල් සවිමත් කළ සේක. තිගේ දරුවන්ට ආශිර්වාද කළ සේක.

තිගේ සීමා තුළ සාමය සිදු කරන සේක. ඉස්තරම් තිරිඟු පිටියෙන් තෘප්තියට පමුණුවන සේක.
එතුමාණෝ ස්වකීය ආඥාව පොළොවෙහි ඉම දක්වා යවන සේක.

එතුමන්ගේ වචන යුහුව පැතිර යයි.

එතුමාණෝ ජාකොබ්ට සිය වචනය ද ඉශ්රායෙල් ට සිය පණත් හා නියමයන් ද ප්‍රකාශ කරන සේක. එතුමාණෝ වෙන කිසි ජාතියකට මෙසේ නොකළ සේක. ඔව්හු එතුමන්ගේ නියමයන් දැන නොගත්තෝ ය.
සමිඳුන්ට ප්‍රශංසා වේවා!

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ජෙරුසලෙම් වැසියෙනි, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
එතුමාණෝ ස්වකීය ආඥාව පොළොවෙහි ඉම දක්වා යවන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ ඔබ කැඳවන ලද්දේ
සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයට පංගුකාරයන් වන පිණිසය.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 17: 22-27

**"ඔව්හු එතුමාණන් මරන්නෝ ය. එහෙත් තුන්වන දා එතුමාණෝ උත්ථාන කරනු ලබන සේක."**

ගලීලයේ නැවතී සිටින අතර ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට, "මනුෂ්‍ය පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලබන සේක. ඔව්හු එතුමාණන් මරන්නෝ ය. එහෙත් තුන්වනදා එතුමාණෝ උත්ථාන කරනු ලබන සේකැ"යි වදාළ සේක. ඒ ඇසූ ඔව්හු අතිශයින් ශෝක වූහ.

ඔවුන් කපර්ණාවුමට ආ කල දේව මාළිගා බද්ද අය කරන්නෝ පේදුරු වෙත අවුත්, "ඔබේ ගුරු දේවයන් දේව මාළිගා බද්ද ගෙවන්නේ නැද්දැ"යි ඇසූහ. "ගෙවන සේකැ"යි ඔහු කීය. ඔහු ගෙට පිවිසි කල යමක් කියන්නට පෙර ජේසුස් වහන්සේ ඔහුට කතා කොට, "සීමොන් මේ ගැන ඔබේ අදහස කුමක්ද? මෙලොව රජවරුන් සුංගම් නොහොත් ආදායම් ගන්නේ කාගෙන් ද? සිය සෙනගගෙන් ද නොහොත් විදේශීන්ගෙන් දැ"යි ඇසූ සේක. "විදේශීන්ගෙන් ය"යි ඔහු කී කල ජේසුස් වහන්සේ කතා කොට "එසේ නම් ස්වදේශීය සෙනග නිදහස් ය. එහෙත් අප ඔවුන්ට බාධාවක් නොවන පිණිස ඔබ මුහුදට ගොස් බිලී බා මුලින්ම අසුවන මාළුවා ගෙන උගේ කට ඇරිය විට රිදී කාසියක් ඔබට සම්බ වන්නේය. එය ගෙන මා සහ ඔබ වෙනුවෙන් ඔවුන්ට දෙන්නැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.